# ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාවේ
# 28 .06.2018 දින පැවැත්වූ දේශනාව

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සර්වඥ සම්මා සම්බුදුපියාණන් වහන්සේට සුපරිසුද්ධ වූ සීල සම්පත්තියෙන් සමන්නාගත වූ ශාන්ත වූ සමාධි සම්පත්තියෙන් සමන්නාගත වූ අශ්ඨ සමාපත්තීන්ගේ වශී භාවයට පත් උනාවූ අශ්ඨ සමාපත්තීන්ගෙන් තමන් වහන්සේගේ සිත වශී කර ගත්තාවූ ධර්මයන්ගෙන් සැප වින්දා වූ දහම් සැප ලෝකයාට විවර කළාවූ ප්‍රඥාවෙන් සමන්නාගත වූ සමාධියේ පිහිටා ප්‍රඥාව විහිදුවා සියුම් වූ ධර්මයන් විනිවිද දැක්කා වූ ධර්මයන් දකින්නා වූ නුවණින් සමන්නාගත වූ ඒ නිසාම කෙලෙසුන්ගෙන් මිදී ගිය පිරිසිඳු සැප විඳින්නා වූ සන්තානයක් ඇති කරුණාවෙන් පිරුණු සන්තානයක් ඇති සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා! ඒ සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ පිරිසිඳු වූ සුපිරිසුද්ධ වූ සමාධි ගතවූ ප්‍රඥාවෙන් පිරීගියා වූ ඒ හිතින් ඒ නුවණින් දැක්කා වූ අවබෝධ කළාවූ දේශනා කළා වූ ශ්‍රී සත්ධර්මස්කන්ධයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා! ඒ ශාන්ති නායක සම්මා සම්බුදු පියාණන් වහන්සේගේ ධර්ම මාර්ගයේ ගමන්කොට නිර්වාණ ධාතුවට වැඩම කොට වදාළා වූ සසර දුකෙන් මිදී ගියා වූ සසර දුකෙන් මිදී යන සීල සමාධි ප්‍රඥා මාර්ගයේ පිහිටියා වූ අශ්ඨ ආර්‍ය පුද්ගල මහා සංඝරත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ආනුභාව බලයෙන් ධම්ම රත්නයේ ආනුභාව බලයෙන් සංඝ රත්නයේ ආනුභාව බලයෙන් අනන්ත ගුණ ඇති ත්‍රිවිධ රත්නයට නමස්කාර කිරීමේ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් මේ පින්වතුන් බණ අසමින් බණ හිතමින් භාවනා වඩමින් නොයෙක් ආකාරයෙන් සිදුකරගත්තා වූ කුසල ධර්මයන්ගේ පුණ්‍යධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ පින්වතුන්ට මේ අවස්ථාවේදී අපි විසින් කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නා වූ ගම්භීර වූ

ධර්ම කොට්ඨාසය ඉතාමත්ම පැහැදිලිව පිරිසිඳුව වැටහේවා! ඒ තථාගතයන් වහන්සේගේ ගාම්භීර වූ සුක්ෂම වූ ඒ ධර්ම කොට්ඨාශය අවබෝධ කරගැනීමට සැමදෙනාගේම සිත් සමාධිගත වේවා! අවශ්‍ය ප්‍රඥාව මතුවේවා! සිහිය මතු වේවා! ඒ ධර්ම කොටස් නිවැරදිව පැහැදිලිව පිරිසිඳුව එක එකක් පාසාම හොඳින් අවබෝධකරගෙන හොඳින් වටහාගෙන ඒ තුලින්ම ආධ්‍යාත්මික වශයෙන් බෝධිපාක්ෂික ධර්ම ශක්තිය වඩාගෙන පාරමී ධර්ම ශක්තිය වඩාගෙන භාවනා කුසලය දියුණුකරගෙන චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කරගෙන බුදුරජාණන්වහන්සේලා පසේ බුදුරජාණන්වහන්සේලා මහා රහත් උත්තමයන් වහන්සේලා සදාකාලික සැපයෙන් නිවී ගියාවූ ඒ උතුම් වූ නිර්වාණ ධාතුව සැපසේ ස්පර්ශ කරන්න නිවනෙන් සැනසෙන්න සැමදෙනාටම මෙය මාර්ගයක්ම වේවා! කියලා මම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

ඒ ප්‍රාර්ථනාවත් එක්ක මේ පින්වතුන්ට අද ගිය සතියේ පැහැදිලි කරලා නවත්තපු තැනක ඉඳලා මම ධර්ම කාණ්ඩයක් කියලා දෙනවා. අපි මේ දවස්වල කථා කරන්නේ පට්ඨාන දේශනාවේ විසර්ජනා වාරයට අයිති **අනන්තර ප්‍රත්‍යය** වීථි ගත වෙන්නේ කොහොමද කියලා. අනන්තර ප්‍රත්‍යය කියන එක අපි දන්නවා. නමුත් මේ වේලාවට මතකය අලුත් කරගන්න උත්සාහ කරන එක හොඳයි. ඒකට හේතුව සූත්‍ර ධර්ම දේශනාවන් අහනවා. ගාථා ධර්ම අහනවා. ජාතක කථා ධර්ම අහනවා. ස්කන්ධ පිළිබඳව අහනවා. බාහිර ලෝකය පිළිබඳව අහනවා. ඒක නිසා මේ ධර්ම විස්තර කරන මාතෘකා ප්‍රදේශයන් හරි විසාලයි, ඒවා වෙනස්. නමුත් ඒ ඔක්කෝම අපි මෙතෙන්ට සම්බන්ධ කරගන්නේ නෑ. එහෙම උනොත් කියලා දෙන, විස්තර කරලා දෙන ධර්ම කාරණය පැහැදිලි කරගන්න අපහසුතාවයක් වෙනවා. ඒ නිසා අද මේ කථා කරලා කියලා දෙන මාතෘකාවට ගැලපෙන කොටස පමණක් අපි හිතේ මතුවට ගන්න ඕන. හිත උඩට ගන්න ඕන. ඒ කාරණය තෙරුම් ගන්න ඕන.

පට්ඨානය කියන්නේ ජාතක දේශනාවක් නොවෙයි. පට්ඨානය කියන්නේ සකන්ධ වශයෙන් දේශනා කරන දේශනාවකුත් නොවෙයි. ඒ ධර්ම තිබෙනවා වෙන්න පුළුවන්. ලෝකයට සම්බන්ධ බාහිර ඕලාරික වස්තු ගැන කියන එහෙකුත් නොවෙයි. මේ පට්ඨාන ධර්මය කථා කෙරෙන්නේ චිත්ත චෛතසික ධර්මයන්ට සම්බන්ධ කරලයි. රූපත් මෙතැන නෑ. නිර්වාණ ධාතුව ගැනත්

මෙතැන කියවෙන්නේ නෑ. පරමාර්ථ ධර්ම 4 තිබෙනවා. 'චිත්ත පරමාර්ථය' 'චෛතසික පරමාර්ථය' 'රූප පරමාර්ථය' 'නිබ්බාන පරමාර්ථය' කියලා. සමහර පට්ඨාන කරුණු ගැන විස්තර විග්‍රහ කරනකොට අපිට මේ 4 සම්බන්ධ කරගන්න සිද්ධවෙනවා. **අනන්තර ප්‍රත්‍යය** පිළිබඳව කථා කරනකොට අහනකොට ඒ පරමාර්ථ ධර්ම 4 න් පරමාර්ථ ධර්ම දෙකක් අපි ස්පර්ශ කරනවා. ඒ තමයි **චිත්ත පරමාර්ථය** සහ **චෛතසික පරමාර්ථය**. කථා නොකර සම්බන්ධ කරගන්නේ නැති පරමාර්ථ ධර්ම දෙක තමයි රූප පරමාර්ථය සහ නිබ්බාන පරමාර්ථය. **අනන්තර ප්‍රත්‍යය** කථා කිරීමේදී අපි දැනගත යුතුවෙන්නේ **චිත්ත පරමාර්ථය** සහ **චෛතසික පරමාර්ථයි**. ඒක අපේ පින්වතුන් අද හොඳට සිහියේ තබා ගන්න. මේකේ වාසිය මේකේ ප්‍රයෝජනය මේ පින්වතුන්ටමයි.

ඊළඟට අනන්තර ප්‍රත්‍යය ගැන කියවනකොට අහනකොට හිතනකොට අපිට තිබෙන්න ඕන දැනුමක් චිත්ත වීථි පිළිබඳව. පටලවාගන්න හොඳ නෑ, චිත්ත වීථි කථාවයි පට්ඨාන දේශනාවේ එන විසර්ජනා වාර වීථි ක්‍රමයයි කියලා කියන්නේ ආකාර දෙහෙකට කථා කරන වීථි ක්‍රමයක්. චිත්ත වීථි පටලවාගන්න හොඳ නෑ මෙතැන විසර්ජනා වාරයෙහි කියවෙන්නා වූ වීථි විග්‍රයට. මේකත් වීථි ක්‍රමයක් තමයි. අපි මීට කලින් ඉගෙන ගත්තා චිත්ත වීථි ක්‍රමයක්. අපේ පින්වතුන් ඒක අහලා තිබෙනවා. ඒ ගැන දැනගෙන තිබෙනවා. ඒක නැවතත් වැඩේට ගැලපෙන හැටියට වැඩේට ප්‍රයෝජනවත් වෙන හැටියට අපේ හිතට මතුකරගන්නවා නම් මේ විදියට හිතන්න. මේ විදියට දැන ගන්න. ඒ තමයි, සිත් පේළි පේළි ඇතිවෙන්නේ. ඒ කියන්නේ අරමුණක් සම්බන්ධයෙන් හිත පැනගෙන එන්නේ එක්තරා ක්‍රමයකට, එක්තරා රටාවකට, එක්තරා විදියකට.

භවාංගයේ ඉඳලා භවාංග චලන - භවාංග උපච්ඡේද හරහා බාහිර වශයෙන් නම් පංචද්වාරාවජ්ජන - චක්ඛු විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන හරහා හත් වාරයක් ජවන් ගතවෙලා ඊට පස්සේ තදාරම්මණ ඇතිවෙලා (සමහරවිට තදාරම්මණ නෑ) නැවතත් භවාංගයට යනවා. මේ විදියට චිත්තක්ෂණ 17 ක යෙදීමක් එක්කාසු කරලා චිත්ත වීථි ක්‍රමයක් අපි මීට පෙර අවස්ථාවලදී බොහෝම විසිතුරුව කථා කළා. ආන්න ඒ චිත්ත වීථි මතක තිබෙන්න ඕනෑ. අපි ඕලාරික වශයෙන් මේ විදියට හිතුවොත්, හිත් පේළියක් යන්නේ - භවාංගය - භවාංග චලනය - භවාංග උපච්ඡේදය - (බාහිර වශයෙන්

නම්) පංච ද්වාරාවජ්ජන - චක්ඛු විඤ්ඤාණය - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන - (කුසල හෝ අකුසල) ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් - ඊළඟට තදාරම්මණ - තදාරම්මණ (ආරම්මණය ගොරෝසු නම් තදාරම්මණ දෙකක් යනවා) නැවතත් සිත භවාංග වෙනවා. ඔය විදියට සිත් පේළි තිබෙනවා. ආන්න ඒ සිත් පේළි වල අද මේ කථා කරන තැන දැන ගන්න ඕන. සමහර වෙලාවට අපි කථා කරන මේවගේ තැන් තිබෙනවා.

- භවාංගයෙන් පංචද්වාරාවජ්ජනයට යන තැන කථා කරනවා.
- පංචද්වාරයෙන් චක්ඛුවිඤ්ඤාණ හංදිය ගැන කථා කරනවා.
- චක්ඛු විඤ්ඤාණයෙන් සම්පටිච්ඡනය සිද්ධ වෙන හන්දිය ගැන කථා කරනවා.
- සම්පටිච්ඡනයෙන් සංතීරණ වෙන හංදිය ගැන කථා කරනවා.
- සන්තීරණයෙන් වොත්ථපනය වෙන හන්දිය ගැන කථා කරනවා.
- වොත්ථපනයෙන් ජවනයට යන හන්දිය ගැන කථා කරනවා.
- එතකොට පළවෙනි ජවනයෙන් දෙවෙනි ජවනයට - දෙවෙනි ජවනයෙන් තුන්වෙනි ජවනයට - තුන්වෙනි ජවනයෙන් හතරවෙනි ජවනයට - හතරෙන් පහට - පහෙන් හයට - හයෙන් හතට යන සන්ධිස්ථානය ගැන කථා කරනවා.
- ඊළඟට හතෙන් අටට යන සන්ධිස්ථාන තිබෙනවා (තදාරම්මණ වලට).

මම මේ පින්වතුන්ට එකේ නොම්බරය දෙකේ නොම්බරය වශයෙන් කිව්වාට මේවා යන්නේ චිත්ත වීථියේ සිත්වලට යොදලා තිබෙන්නා වූ නම් සම්බන්ධ කරගෙනයි. නම් සම්බන්ධ කරගන්න කොට මේ හිතකට සමහර වෙලාවට නම් දෙක තුනක් වැටෙනවා ඒ හිත්වලින් කරන වැඩ වල හැටියට. අපේ පින්වතුන් ඒ විවිධ නම් දැනගන්න එක කාරණය පැහැදිලිව තේරුම් ගැනීමට හරියට ප්‍රයෝජනවත් වෙනවා. ඔය ටික හිතේ තියා ගන්න. මේ ටික අපිට උදව්වෙන උපකාර වෙන keywords හැටියට මතක තබා ගන්න.

දැන් අපි යමු ගිය සතියේ මතක් කරලා කියලා දීපු කාණ්ඩයේ ඉතිරි හරියට. තවත් එක කාරණයක් මතක තබා ගන්න. ඒ තමයි, මේ කථා කරන මාතෘකාවට දැන ගන්න ඕන ‘කුසල ධර්ම’ ‘අකුසල ධර්ම’ ‘අව්‍යාකෘත ධර්ම’ කියන වචන තුන. ඒ වචන තුනෙන් කියන්නේ මොකක්ද කියන එක. **කුසල ධර්ම** කියලා කියන්නේ **කුසල් ජවන්**. අකුසල් සිත් 12 ජවන් හරියේ වැඩ කරන සිත්. මේවට අකුසල් ජවන් කියලා කියනවා. තව තිබෙනවා කුසල ජවන. ඒ තමයි කාමාවචර

කුසල සිත් 8 + රූපාවචර කුසල් 5 + අරූපාවචර කුසල් සිත 4 + ලෝකෝත්තර කුසල් සිත් 4 කියලා කුසල් සිත් තිබෙනවා. මේවට කියනවා කුසල ජවන කියලා. ඔය තැන් දෙකේ වැඩ කරන්නේ නැති තව සිත් තිබෙනවා. 'විපාක' 'ක්‍රියා' ආදිය සියල්ල ගණන් ගන්නේ අව්‍යාකෘත කියන ගොඩට. නමුත් මේ වාක්‍ය කියන කොට තික මාතිකාවේ අපි ඔය විදියට නොවෙයි කියන්නේ. උගන්නන කොට නම් අකුසල ධර්ම ඉස්සෙල්ලා කියලා තමයි කුසල ධර්ම වලට යන්නේ. අහේතුක ධර්ම කියනවා, කුසල අකුසල ධර්ම කියනවා. දැන් අපි බලමු දෙවෙනි වීථිය.

2). **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** = කුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

මෙතනදී **කුසල ධර්මයක්** කියලා කියන්නේ අකුසලත් නොවෙයි, අව්‍යාකෘත යෙකුත් නොවෙයි. එහෙම නම් කුසල ධර්ම කියලා කියන්නේ ලෞකික කුසල ධර්ම 17 (කාමාවචර සිත් 8 + රූපාවචර සිත් 5 + අරූපාවචර කුසල් සිත් 4). ඊළඟට ලෝකෝත්තර කුසල ධර්ම = මාර්ග සිත් 4. ඔක්කොම කුසල් සිත් 21. මේ වීථියේ **කුසලෝ ධම්මෝ** කියන කොට මේ සිත් 21 කේ මොකක් හරි සිතක් ඇත්ද ඒ තමයි **'කුසල ධර්මය'**. නමුත් **අබ්‍යාකතස්ස ධම්මස්ස** කියලා කියන්නේ කුසල ධර්ම නොවෙයි. එහෙම නම් අව්‍යාකෘත වශයෙන් වෙන ධර්ම තිබෙනවා අහේතුක සිත්වල එහෙම. අපි චිත්ත වීථියකට දාල මේ විදියට බලමු.

දැන් මේකේ තිබෙන්නේ කුසල ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන එක. අනන්තර ප්‍රත්‍යය කියලා කියන්නේ පළමුවෙන් පහළ උනා වූ සිත නැතිවෙලා වැනසිලා අභාවයට යනකොට ඒ නැතිවී යන හිතෙන් අමුතු හුමාලයක් වගේ යම් කිසි ආකාර ගතියක් යම් කිසි ශක්ති ගුණ විශේෂයක් ඒ එක්කම පහළ වෙන්නා වූ හිතට තල්ලුකරගෙන වද්දාගෙන යන්නා වගේ එකක් තිබෙනවා. ඒකට කියනවා **අනන්තර ප්‍රත්‍යය ශක්තිය** කියලා. අනන්තර ප්‍රත්‍යය ශක්තිය තිබෙන්නේ පළමුවෙන් පහළ වෙන හිතේ. ඒකෙ ශක්තිය වදින්නේ දෙවෙනුවට පහළ වෙන හිතටයි. අද මේ කියන කථාවේ පළමුවෙන් පහළ වෙලා නැතිවෙන හිත **කුසල සිතක්**. ඒකයි **කුසලො ධම්මො** කියන්නේ. ඒ කුසල ධර්ම හැටියට පහළ වෙච්ච හිත ඇතිවී නැතිවෙලා

යනකොට ඊළඟට පහළ වෙන්නේ අව්‍යාකෘත හිතක්. ඒ අව්‍යාකෘත හිතට (ඒක ක්‍රියා අව්‍යකෘතයක් වෙන්න පුළුවන්, විපාක අව්‍යාකෘතයක් වෙන්න පුළුවන්) අර ඉස්සෙල්ලා පහළ වෙච්ච කුසල සිතෙන් යම් කිසි ශක්තියක් ඒ වාගේම ආනුභාවයක් යම් කිසි ගැම්මක් යම් කිසි ආකාර විශේෂයක් ලැබෙනවා. ආන්න ඒකට තමයි කියන්නේ **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා.

තව දෙයක් මේකේ බොහොම සරලව තේරුම් ගන්න ඕනෑ. දැන් අනන්තර ප්‍රත්‍යය තිබෙන තැනකුත් තිබෙනවා අනන්තර ප්‍රත්‍යය ලබන්නාවූ කෙනෙකුත් ඉන්නවා. අනන්තර ප්‍රත්‍යය තිබෙන්නේ පළමුවෙන් නැතිවී යන්නා වූ සිතේ. ඊළඟට අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලබන්නේ දෙවෙනියට පහළ වෙන්නාවූ සිතයි. ඉස්සරවෙලා පහළ වෙලා නැතිවී යන්නාවූ සිතෙන් ලැබෙන්නා වූ අනන්තර ප්‍රත්‍යය ශක්තියේ ආනුභාවය, ඒකෙ benefit එක, ඒකෙ ආකාරය ලබාගෙන පහළ වෙන්නේ දෙවෙනි හිතයි. ඒක නිසා දෙවෙනි හිතට කියනවා ඉස්සරවෙලා පහළ වෙච්ච සිතෙන් අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලබාගෙන පහළ වෙන **ප්‍රත්‍යය උප්පන්නය** කියලා. මේ කියන කථාවට අනුකූලව දෙවෙනි සිත එනම් ප්‍රත්‍යය ලබන සිත අද මේ කථා කරන මාතෘකාවේ **අව්‍යාකෘතයක්**. ඔන්න ඕක තමයි අපිට සරලව තේරුම් ගන්න ඕනෑ කාරණය.

දැන් අනන්තර ප්‍රත්‍යය ලබාගෙන ප්‍රත්‍යය උප්පන්න හැටියට පහළ වෙන දෙවෙනි සිතේ එනම් **ප්‍රත්‍යය උප්පන්නය** ගැන මෙහෙම කියනවා.

- **සන්තීරණ** වශයෙන් සිත් තුනක් තිබෙනවා. සන්තීරණ කියන සිත් ජාතිය කුසල් සිත් නොවෙයි. සන්තීරණ සිත් කියන්නේ අකුසල් සිතුත් නොවෙයි. ඒවා 'හේතු' සිතුත් නොවෙයි. මේ සන්තීරණ සිත් තුන අහේතුක සිත් 18 කථා කරන සිත් තුනක්. එනම් **අව්‍යාකෘත** සිත් තුනක්.

- **විපාක** සිත් එනම් කාමාවචර කුසල් සිත් වගේම විපාක සිතුත් 8 ක් තිබෙනවා. ඒ විපාක සිත් 8 **විපාක අව්‍යාකෘත** ජාතියක්. දැන් එතකොට ඉස්සෙල්ලා සිත් 3 මේ අටයි ඔක්කොම 11 යි.

- ඊළඟට තිබෙනවා අපි රූපාවචර ධ්‍යාන භාවනා වැඩුවහම ඒවායේ විපාක 5 ක් හම්බවෙනවා. අරූපාවචර ධ්‍යාන භාවනා වැඩුවහම ඒවායේ විපාක සිත් 4 හම්බවෙනවා. මෙතන විපාක 9 ක් තිබෙනවා. මුලින් කියපු සිත් 11 + 9 = 20 යි. මේවා **ලෞකික අව්‍යාකෘත** ධර්ම 20.

- තව තිබෙනවා. ලෝකෝත්තර මාර්ග සිත කුසල සිතක්. ඉස්සෙල්ලාම නිර්වාණය පිරිමදින, නිර්වාණය ළඟට යන, නිර්වාණය දකින, නිර්වාණයට බාධක වෙලා තිබෙන කෙලෙස් නසන ඒ මාර්ග සිත කුසල සිතක්. ඒ කුසල හැකියාව ඒ සිතට තිබෙන නිසයි කෙලෙස් එහෙම නැසෙන්නේ. මීට පසුව ඇතිවෙන ඵල සිත කුසල සිතක් නොවෙයි. **ඵල සිත අව්‍යාකෘත** සිතක්.

මේක හොඳට තේරුම් ගනිමු. **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන තැන ජීවිතියේ අත් විඳින තැනකට එමු. එතකොට මේක තේරුම් ගන්න තව අපිට පහසු වෙයි. ඒ තමයි අපි මේ ඇහැ ඇරලා වට පිට බලනවා කන යොදලා අසල තිබෙන සහ ඇහෙන ප්‍රමාණයේ දුර තිබෙන ශබ්ද අහනවා. ගඳ සුවඳ දැන ගන්නවා. දිවෙන් රස දැනගන්නවා. කයෙන් ස්පර්ශය දැන ගන්නවා. හිතෙන් හිතනවා. මේ පළමුවෙනි 5 ද්වාරික සිත්. පංචද්වාරාආවජ්ජන සිත බාහිර වශයෙන් යන එකක්. අපි අද මේ කථා කරන කථාවේදී දේශකයා පේන්නෙත් නෑ. ශ්‍රාවකයෝ පේන්නෙත් නෑ. කවුද දෙසන්නේ කියන සංඥාව තිබෙනවා පින්වතුන්ට. මේ ස්වාමීන්වහන්සේ නමක් දේසනා කරනවා කියන දේසක සංඥාව තිබෙනවා. දේශකයා රූපමය වශයෙන් පේන්නේ නෑ. නමුත් මනෝමය වශයෙන් චිත්ත රූපයක් සංඥාවක් හදාගෙන තිබෙනවා. දේසනා කරන මට ශ්‍රාවකයෝ පේන්නේ නෑ. මොන විදියට ඉන්නවද බිම වාඩි වෙලාද පුටුවක වාඩිවෙලා ද ඇඳක ඉන්නවද හාන්සි පුටුවකද ඒ මොකක්වත් පේන්නේ නෑ. හැබැයි ශ්‍රාවක සංඥාව තිබෙනවා. 'ශ්‍රාවකයෝ පිරිසක් මේ මේ රටවල්වල මේ මේ පළාත්වල මෙහෙම නිවෙස් වල ඉඳගෙන තැන් තැන් වල ඉඳගෙන අහනවා' කියන හැඟීම ඒ සංඥා රූපය තිබෙනවා. ඒක මානසිකයි. හැබැයි දේශක ශ්‍රාවක දෙපක්ෂයේම සම්බන්ධීකරණය සිද්ධ වෙන්නේ අපේ කන නිසා.

ඒක නිසා අද මේක තේරුම් ගන්න හොඳටම උපකාරවෙන්නේ සෝත ද්වාරික චිත්ත වීථියක්. අපේ පින්වතුන් මම කියන වචන අහනවා. එක චිත්ත වීථියකින් වැඩි යමක් කරන්න බෑ. මේ කථා කරන ශබ්ද වල එක වචනයකත් පුංචිම පුංචි කෑල්ලක් විතරයි එක චිත්ත වීථියකින් අහුලා ගන්න පුළුවන් වෙන්නේ. හරියට කියනවා නම් සමහර සත්තු ඉන්නවා පුංචි පුංචි කූඹියෝ කඩි අල්ලාගෙන කනවා. ඒ සත්තුන්ගේ දිව හරි දිගයි. දිගට දිව එළියට දාලා සමහර වෙලාවට ඉරටු කූරක් වගේ සමහර වෙලාවට පොඩි රබර් පටි කෑල්ලක් වගේ එළියට දිව දාලා අර කඩි කූඹි වගේ සත්තු අහුලාගෙන කනවා. ඒ වගේ, මේ අපේ හිත එළියට ගිහිල්ලා පොඩි ශබ්ද කෑල්ලක් අහුලාගෙන ඇවිල්ලා ආයේ යනවා තව කෑල්ලක් අහුලා ගන්න. ඔය වගේ අපේ චිත්ත වීථි යනවා.

මේ සෝත ද්වාර චිත්ත වීථියේ මේක සිද්ධ වෙන්නේ මේ පින්වතුන්ගේ හිත්වල. **භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද** යන මේ සිත් තුනම **අව්‍යාකෘතයි.** ඒවා භවාංගයට සම්බන්ධයි. **පංචද්වාරාවජ්ජන** සිතත් **අව්‍යාකෘතයි.** ඊට පස්සේ සෝත විඤ්ඤාණ සිත. ඒකත් **විපාක අව්‍යාකෘතයක්.** ඊට පස්සේ **සම්පටිච්ඡන - සන්තීරණ** මේවාත් **විපාකයි.** ඊට පස්සේ **වොත්ථපන** සිතත් **අව්‍යාකෘත සිතක්.** මේ සිත් පේළියම මෙතනට එනකම්ම, එනම් **භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංච ද්වාරාවජ්ජන - සෝත විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන** යන මේවා ඔක්කෝම කුසල් වෙන්නෙත් නෑ අකුසල් වෙන්නෙත් නෑ. ඒක නිසා මේවා ඔක්කොම **අව්‍යාකෘත** භාවයේ පිහිටි **සිත්.**

ඊට පස්සේ යනවා ශබ්දය. සෝත විඤ්ඤාණය පහළ වෙලා ශබ්දය බාර අරගෙන ශබ්දය ගැන හිතවෙන සිත් පෙළක් යනවා. ඒ යන්නේ ජවන් සිත් පෙළක්. ඒ ජවන් සිත්පෙළ කුසල හෝ අකුසල හෝ වෙනවා. දැන් එතකොට බලන්න ඉස්සරවෙලා අව්‍යාකෘත පේළියක් තිබුණා. ඇත්තවශයෙන්ම ශබ්දය ගන්නෙත් අව්‍යාකෘතයකින්. ඊට පස්සේ තමයි කුසල හරි අකුසල හරි ජවන් යන්නේ. දැන් මේ කථාව අද කියන මාතෘකාවට ගත්තයින් පස්සේ අව්‍යාකෘත වලට පස්සේ කුසල වෙනවා කියලා නොවෙයි කියන්නේ. අව්‍යාකෘතයකට පස්සේ අකුසල වෙනවා කියලවත් නොවෙයි මේ කියන්නේ. **කුසලයකට පස්සේ අව්‍යාකෘත වෙනවා කියන එකයි මේ මාතෘකාවෙන් කියන්නේ.**

එහෙම නම් අපි තැනකට යන්න ඕන. ඒ තමයි ජවන් සිත් 7 ක් යනවා. ඒ ජවන් සිත් 7 අපි හිතමු කුසල් උනා කියලා. බණ අහන එකනේ මේ සිද්ධවෙන්නේ. බණ අහනකොට සිද්ධ වෙන්නේ කුසල්. ගිය පාර කිව්වා වගේ පළවෙනි කුසලයෙන් දෙවෙනි එකට යනකොට **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස** වෙනවා. දෙකෙන් තුනට - තුනෙන් හතරට - හතරෙන් පහට - පහෙන් හයට - හයෙන් හතට - සියල්ල **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස.** අවසාන කුසල් ජවනයෙන් පස්සේ පහළ වෙන්නේ කුසලයක් නොවෙයි, ඒක සන්තීරණයක් හරි භවාංගයක් හරි. විශේෂයෙන් මෙතන කියන්නේ සන්තීරණය ගැන. සන්තීරණ තුනකුත් තිබෙනවා. අකුසල සන්තීරණ තිබෙනවා 8 ක්. ඒ ඔක්කොම 11 වෙනවා. ඒ විස්තරේ කෙටි කළොත් එහෙම 7 වෙනි ජවනයට පස්සේ ඇතිවෙන හිත සන්තීරණයක්. මේ පින්වතුන් බණ අහන මේ වෙලාවේ චිත්ත වීථි වලින් තමයි මේ ශබ්දය හසුකර ගන්නේ සහ හිතන්නේ. ඒකෙනුත් ජවන් හිත දුවනවා. මේ පින්වතුන්ගේ සිත් තුල ජවන් සිත් පේළි පේළි යනවා. ඒ ජවන් සිත් මේ පින්වතුන්ට නොදැනුවත් උනාට, තමන්ට ජවන් සිත් තේරුම් ගැනීමට බැරි උනාට ප්‍රායෝගික වශයෙන්, සුතමය ඥානය චින්තාමය ඥානය නම් හැබැවටම තිබෙනවා. නමුත් ප්‍රායෝගිකව ඕක දකින්න අමාරුයි. චින්තාමය ඥානය සුතමය ඥානය ගොනුකරගෙන පාවිච්චියට අරගෙන බැලුවහම මේ පින්වතුන්ගේ සිත්වල චිත්ත වීථි ගොඩක් යනවා. එතකොට අවසාන ජවනයට පස්සේ පහළ වෙනවා කුසලාරම්මණික තදාරම්මණයක් හෝ භවාංගයක්. ඒ තදාරම්මණය කියන්නේ **අව්‍යාකෘත** හිතක්. ඒක නිසා එතනදී කියලා දෙන ධර්මය තමයි චිත්ත වීථියක අවසාන ජවනයයි ඊට පස්සේ පහළ වෙන තදාරම්මණයයි අතර හංදියක් තිබෙනවා. ඒ හංදිය ගත්තම **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන කථාව මේ පේළියේ ලස්සනට කියලා දෙනවා. අවසාන ජවනය කුසල ජවනයක්. නමුත් ඒ කුසල ජවනය ඉවර වෙලා යනකොට ඊට පස්සේ තව දුරටත් ජවන් දුවන්න බෑ. ජවන් දුවවන්ට හයිය හත්තිය නෑ. එහෙම ධර්ම ස්වභාවයක් නෑ. නමුත් ඒ අවසාන ජවන් සිතේ ඒක නැතිවෙලා යනකොට ඒකෙ තිබෙනවා අමුතු ගුණ ශක්තියක්, ආකාර විශේෂයක්, ධර්ම විශේෂයක්. ඒකට කියනවා **අනන්තර ප්‍රත්‍යය ශක්තිය** කියලා. ඒ අනන්තර ප්‍රත්‍යය ශක්තිය අර ඊළඟට පහළ වෙන තදාරම්මණය කියන අව්‍යාකෘත හිතට අමුතු ගැම්මක්, පිහිටක්, ආකාරයක්, printout එකක්, help එකක් තල්ලු කරගෙන ඇතිවීගෙන යනවා කියන එකයි මේ කියන්නේ.

සමහර අය ඉන්නවා අපේ වයසට ගිහිල්ලා, ඒ අය යමක් කමක් තිබ්බව මිනුස්සු. අපි හිතමු ඉඩමක් තිබ්බව මනුස්සයා ඒ ඉඩම හිමිකරගෙන තමන්ගේ කියලා ජීවිත කාලයේදීම ඉඳලා එයා මැරෙන අවස්ථාවේදී ඒ ඉඩමේ අයිතිය ඊළඟට එයාගේ පරපුරෙන් තවත් පුරුකකට ඔප්පුවකින් හරි කට වචනයකින් හරි ලියවිල්ලකින් හරි එයා පැවරීමක් කරනවා මගේ ඇවෑමෙන් මෙන්න මේ ශක්තිය ඔබටයි කියලා. එහෙම පවරලා එයා මැරෙනවා. මැරුණට පස්සේ ඒ එක්කෙනා දීපු ශක්තිය දෙවෙනි එක්කෙනා පාවිච්චි කරනවා. පරිභෝගයට ගන්නවා. ඕක මාලයක් කරාබුවක් වගේ දෙයක් වෙන්නත් පුළුවන්. ඉඩමක් කඩමක් සම්බන්ධයෙන් වෙන්නත් පුළුවන්. පිඟානක් කෝප්පයක් සම්බන්ධයෙන් වෙන්නත් පුළුවන්. හැබැයි ඒ තමන්ට අයිති දේ සමහරවෙලාවට මෙහෙම වෙනවා. තමන්ට අයිති දේ දෙනවා තමන්ගේ ළඟම ඉන්න දුවෙකුට හරි පුතෙකුට හරි, මේක මගේ ඇවෑමෙන් කියලා තමන්ට තිබුණ ශක්තිය මැරෙනකොට පවරාගෙන තල්ලු කරගෙන යනවා. හැබැයි ඒක අනිවාර්ය නෑ. සමහර අයට දුවලා පුත්තු ඉන්නවා, නැති අයත් ඉන්නවා. සමහර වෙලාවට තිබෙනවා මුණුබුරෙකුට හෝ මිනිබිරියකට තමන්ගේ අයිතිය, තමන්ගේ ශක්තිය, තමන්ගේ ආනුභාවය, පවරාගෙන තල්ලුකරගෙන යනවා. ඊළඟට තිබෙනවා, එයා කාන්තාවක් නම් එයා පවරන දේ ලබාගන්න එක්කෙනා කාන්තාවක්ම වෙන්න ඕන නෑ. ඒ වගේ ජවන් සිතක් නැතිවෙලා යනකොට ඒකෙ ශක්තිය නැවත පහළ වෙන ජවනයකටම දෙන්න කියලා නීතියක් නෑ. මෙතැන දෙන්නේ තදාරම්මණයකටයි. ඒවාගේම තමයි දුවලත් නැති පුතාලත් නැති සමහර අය තමන්ට හම්බ වෙච්ච දේවල් එයා මැරෙන කොට පන්සලට පූජා කරනවා. ස්වාමීන්වහන්සේලාට පවරනවා. සාසනයට පවරනවා. සාසනය කියන්නේ එයාගේ දරුවෙක් නොවෙයි. සාසනය කියන්නේ ස්වාමීන්වහන්සේලාගේ පුතෙක් දුවෙක් නොවෙයි, නමුත් තමන්ට නෑ කමක් නැති, තමන්ට සමාන කමක් නැති එහෙකට තමන් මිය පරලොව යනකොට තමන්ගේ භාර කාරත්වය තමන්ගේ ශක්තිය දෙනවා. පන්සලකට සේනාසනයකට ආරණ්‍යයකට ස්වාමීන්වහන්සේලාට දෙනවා. දැන් බලන්න ඒකෙ ශක්තියට සමාන කමක් අවශ්‍ය නෑ. නමුත් පළමුවෙනි කෙනා මැරී යනකොට දෙවෙනියට පැවරුම වෙනස් එකක් ගන්නවා.

ඒක නිසා ජවන් සිතක් තමයි මේ **අනන්තර ප්‍රත්‍යය** කරන්නේ. ඒ කියන්නේ හත්වෙනි කුසල ජවනය. දෙවෙනියට පහළ වෙන තදාරම්මණය **අව්‍යාකෘතයක්.** ඒක නිසා ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ මේ දේශනාව **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන තැන හරි ලස්සනට මේ කියන්නා වූ ලෞකික කුසල වීථියකට දාල හොඳට පැහැදිලි කරනවා. මේක ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ බුදු නුවණින් ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ සර්වඥතාඥාන මණ්ඩලයේ ඒ ධර්මය දකින්නා වූ සිත් පිළිබඳව දකින්නා වූ ඒ විසිතුරු නුවණින් ඉතාමත්ම පැහැදිලිව පිරිසිඳුව මේ කාණ්ඩය මේ පුංචි පුරුක හොඳට දැකලා තිබෙනවා. උන්වහන්සේගේ අනුයාත, උන්වහන්සේගේ ධර්මයෙන් උපන්නා වූ පුත්‍ර රත්නයක් වෙන්නා වූ සාරිපුත්‍ර මහරහතන් වහන්සේ මේ කාරණය හොඳට දැකලා තව විග්‍රහ කරනවා මේ නියායට දාලා. ඒක නිසා අද මේ වේලාවේදී **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන තැන අපි තේරුම් ගත්ත විදිය. මම විස්වාස කරනවා මේ පින්වතුන්ට මේකෙන් යම් කිසි වැටහීමක් ගැලපීමක් හදාගන්න පුළුවන් වෙන්න ඇති කියලා.

ඊළඟට කියමු අපි මෙහෙම. සමහර වෙලාවට ඔය හැම චිත්ත විථියකටම හත්වෙනි ජවනයට පස්සේ තදාරම්මණ ඇති වෙන්නෙම නෑ. මුල් චිත්ත වීථිවල විතරයි තදාරම්මණ ඇතිවෙන්නේ. සමහර චිත්ත වීථිවල හත්වෙනි ජවනයෙන් පස්සේ තදාරම්මණ පහළ වෙන්නේ නැතුව කෙලින්ම භවාංග වෙනවා. එතකොට වෙන්නේ මොකක්ද? භවාංගය කියන්නේ අව්‍යාකෘතයක්. එතනදිත් කුසල චිත්ත වීථියක අවසාන ජවන් සිතෙන් පස්සේ භවාංගයක් ඇතිවෙන කොට එතැන සිද්ධ වෙන්නෙත් **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන එකයි. එහෙම අමුතු ගැම්මක් අර පළවෙනි හිත දීගෙන යනවා.

ඊළඟට මෙහෙම කථාවක් කියනවා. මේ සත්වයෝ ඉන්න තැන් වලට කියන වචන තිබෙනවා, ඒක අපේ පින්වතුන් දැනගන්න එක හොඳයි. 'ඒක වෝකාර' 'චතු වොකාර' 'පංච වෝකාර' කියලා භව විස්තර කරන්නාවූ ක්‍රමයක් තිබෙනවා. රූපයත් තිබෙන වේදනා ගුණයත් තිබෙන සංඥා ගුණයත් තිබෙන සංස්කාර ගුණයත් තිබෙන විඤ්ඤාණ ගුණයත් තිබෙන මේ පහම

එක්කාසුවෙලා පහම ක්‍රියාත්මක වෙන සත්වයෝ ඉන්නවා සංසාරේ. මේ හේතු ඵල රාමුවේ දිව්‍යලෝක බ්‍රහ්මලෝක මනුස්ස ලෝක තිරිසන් ආදී ඔය හැම තැනම ඔය පහම තිබෙන සත්වයෝ ඉන්නවා. ඔය අයට කියනවා 'පංච වෝකාර' භවිකයෝ කියලා. අපිත් 'පංච වෝකාර' භවිකයෝ. දේසනා කරන මම 'පංච වෝකාර' භවිකයෙක්. අසන්නා වූ මේ පින්වතුන් 'පංච වෝකාර' භවික සත්වයෝ. සමහර තැන් වල ඕකේ එකක් විතරක් පිහිටනවා. ඒ කියන්නේ වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කාණ්ඩ 4 නැතුව රූපය පමණක් තිබෙන තැනක් තිබෙනවා. කල්පනා කරන්න බෑ, හිතෙන්නේ නෑ මොකක්වත්, අහන්න බෑ නමුත් කර්මයෙන් හටගත්ත රූපයක් පමණක් පවතිනවා. ඕක සත්වයෙක් හැටියට නම් කලත් කන්න බොන්න යන්න එන්න මොකක්වත් කරන්න බෑ. ඒ අයට කියනවා 'ඒක වෝකාර' භවිකයෝ කියලා. 'චතු වෝකාර' කියලා කියන්නේ සමහර සත්වයන්ට රූපය නෑ. වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ යන කොටස් හතරක් පමණක් තිබෙනවා. අරූප ලෝක වල ඉන්න සත්වයෝ 'චතු වෝකාර' සත්වයෝ. මනුස්සලෝකයේ ඉන්න අපි, දෙවියෝ, රූපාවචර බ්‍රහ්මලෝකයේ ඉන්න බ්‍රහ්මයෝ සහ සුද්ධාවාස බ්‍රහ්මලෝකවල සිටින බ්‍රහ්මයන් සියල්ලම 'පංච වෝකාර' භවිකයන්.

එතකොට මේකේ තිබෙනවා පංච වෝකාර භවිකයන් වෙන අපි රූපාවචර කුසල් වඩනවා. ඒ කියන්නේ අපි භාවනා කරනවා. භාවනා කරන කොටත් ඇතිවෙන්නේ කුසල ජවන් සිත්. අපි හිතමු ප්‍රථම ධ්‍යානය වඩනවා කියලා. ප්‍රථම ධ්‍යානය තිබෙන්නා වූ එක්කෙනාගේ ප්‍රථම ධ්‍යාන සිත පහළ උනාට පස්සේ ඒ ධ්‍යාන චිත්ත වීථිය ගිහිල්ලා අවසානයට වැටෙන්නේ භවාංගට. එතැනදිත් වෙන්නේ **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො.** ඒ කියන්නේ රූපාවචර ධ්‍යාන කුසලයේ ඒ ජවන් පේළියේ අවසානයට පස්සේ පහළ වෙන්නේ භවාංගයක් නිසා එතැනදීත් කියනවා **කුසල ධර්මය අව්‍යාකෘතයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා** කියලා. වෙන අකුසලයක් එන්න නොදී වෙන මොකකටවත් එන්න නොදී හරියටම භවාංගයට set කරලා දෙන ගතියට කියනවා **අව්‍යාකෘතයට ප්‍රත්‍යය** වෙනවා කියලා. කාමාවචර සිත් වලත් මේ විදියමයි.

ඊළඟට තිබෙනවා, අරූපාවචර බ්‍රහ්මලෝකවලට යන්න භාවනා කරන කොට අරූපාවචර ධ්‍යාන සියල්ල උපේක්ඛා සහගතයි. ඒ උපේක්ඛා සහගත ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නේවසඤ්ඤා නාසඤ්ඤායතනය යන මේ සියල්ල උපේක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත කුසල් සිත්. මේ ධ්‍යාන සිත් අවසානයේ පහළ වෙන්නේ භවාංග. මේ කුසල සිත අවසානයේ භවාංග ගතවෙන කොට ඒකටත් කියනවා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො කියලා.**

කුසල ජවන් යන හරියේ වැඩ කරන්නේ කුසල් සිත් 8 න් සෝමනස්ස සහගත සහ උපේක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත කුසල් සිත් පමණයි. ඒකත් මතක තබා ගන්න.

ඊළඟට තිබෙන හරිය ගාම්භීරයි සූක්ෂමයි. අත් විඳින්න බැරි උනත් ප්‍රණීතයි. ඉතාම ගාම්භීර ශාන්ත ප්‍රණීත ධර්මයක් ක්‍රියාත්මක වෙන තැනක් මේ පින්වතුන්ට මේ ඉස්සරහදි කියන කොටසින් තේරුම් ගන්න පුළුවන් වෙයි. අත් විඳින්නට නම් අනාගාමී කෙනෙක් හැටියට අෂ්ඨ සමාපත්ති තිබෙන්න ඕන. රහතන්වහන්සේ නමක් හැටියට අෂ්ඨ සමාපත්ති තිබෙන්න ඕන. එවෙනි කෙනෙකුට තමයි මෙන්න මේ හරියේ කියවෙන ධර්ම රසය ඒ ධර්ම ශාන්තිය ප්‍රායෝගිකව අත් විඳින්නට පුළුවන් කම තිබෙන්නේ. එහෙම නැති අපිට ඒ ගැන හිතාගෙන ඒ ගැන චිත්තය හරවලා පොඩ්ඩක් බලාගෙන සුතමය ඥානය වශයෙන් හරි චින්තාමය ඥානය වශයෙන් හරි සංකල්පනාත්මකව ධර්ම රසයක් හිතකට රහ ගන්වා ගන්න පුළුවන්.

ඒක හරියට කියනවා නම් අපි ඔය restaurants ගාවින් යනකොට වීදුරු දාල ලස්සනට මේස තියලා හැඳි ගෑරුප්පු තියාගෙන ඇතුලේ කන මිනුස්සු දිහා බලාගෙන යනකොට අපි ඒ restaurant එකේ නැති උනත් අපි කෑවේ නැතත් කන මිනුස්සු දිහා බලාගෙන 'මෙයා මේ විදියට කනවා ඇති' කියලා අදහසක් අපේ හිතේ පහළ වෙනවා. සමහර වෙලාවට යාළුවෝ දෙන්නෙක් එහෙම යනවානම් 'මෙයා නම් හොඳට කනවා කෑමක්' කියලා පොඩි වාක්‍යයකුත් ඔතෙන්ට පාවිච්චි කරනවා. හැබැයි ඒ වාක්‍යය ඒ විදියට ප්‍රකාශ කරන්න එයාගේ හිතෙනුත් අර කන මනුස්සයා ගාවට ගිහිල්ලා පොඩි සංඥාමය චිත්තමය ගැවසීමක් කරනවා. එහෙම කරලා තමයි එයා ඒ වාක්‍යය කියන්නේ. මේක උදාහරණයක්.

දැන් මේ කියන කථාව තේරුම් ගන්න. රහතන්වහන්සේ නමක් විඳින්නා වූ නිවන් සැපය නිරෝධ සමාපත්තිය පිළිබඳව මේ විදියට විස්තර කරනවා.

නිරෝධ සමාපත්තියට සම වදින්න බෑ අෂ්ඨ සමාපත්තීන් නැතුව. අෂ්ඨ සමාපත්ති කියලා කියන්නේ සූත්‍ර ක්‍රමයේ හැටියට 'ප්‍රථම ධ්‍යානය' 'ද්විතීය ධ්‍යානය' 'තෘතීය ධ්‍යානය' 'චතුත්ථ ධ්‍යානය' 'ආකාසානඤ්චායතන සමාධිය' 'විඤ්ඤාණඤ්චායතනය සමාධිය' 'ආකිඤ්චඤ්ඤායතන සමාධිය' 'නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාධිය' යන 8 තිබෙන්න ඕන. මේක චිත්ත ක්‍රියාවත් එක්ක සිද්ධ වෙන සිත ක්‍රියාත්මක වෙන සමාධි ගුණ 8 ක්. හැබැයි 9 වෙනි එකට කියනවා 'නිරෝධ සමාපත්තිය' කියලා. නිරෝධ සමාපත්තියේ චිත්ත චෛතසික ධර්ම වැඩ කරන්නේ නෑ. චිත්තජ රූපත් නෑ. ඒකෙන් නිවන් අරමුණුකරන්නෙත් නෑ. හැබැයි නිවනේ ගැවසෙනවා. සිතත් නොවෙයි, නමුත් නිවී තිබෙනවා. එතකොට සිත් අවස්ථා 8 වැඩ කරනවා 9 වෙනි අවස්ථාව සිත නැතුව යම් කිසි පැවැත්මක් තිබෙනවා, යම් කිසි ගතියක් තිබෙනවා. මේ ස්ථාන 9 යට සූත්‍ර දේශනා වල ලස්සනට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා **නව අනුපුබ්බවිහාර** කියලා. ඒ කියන්නේ හැසිරීම් ස්ථාන, වැඩ ඉන්න ස්ථාන 9 ක්. මේ නිරෝධ සමාපත්තියේදී සිත නෑ නමුත් ඊට කලින් සිද්ධ වෙන විදියක් තිබෙනවා.

නිරෝධ සමාපත්තියට සමවදින එක්කෙනා අනාගාමී වෙන්න ඕනෑ. අනාගාමී උනා කියන්නේ ඒ අනාගාමී ඵල චිත්තය තිබෙනවා. ඒකට ක්‍රමානුකූලව යන්න ඕන. පළවෙනි ධ්‍යානයෙන් දෙකට දෙවෙනි ධ්‍යානයෙන් හතරට එහෙම යන්න බෑ. 'එක' 'දෙක' 'තුන' 'හතර' වශයෙන් පිළිවෙලින් සමවැදීම් ක්‍රමයට ගානට ක්‍රමානුකූලව ගිහිල්ලා ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට ගිහිල්ලා ආකිඤ්චඤ්ඤායතනයෙන් ගොඩවෙලා නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට ගිහිල්ලා නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසලය පහළ වෙච්ච ගමන්ම හිත නිවන් පැත්තට ගිහිල්ලා නවතිනවා. එතකොට දැන් මේ අනාගාමීන් වහන්සේගේ හෝ රහතන්වහන්සේගේ හිත නැවතුනා. අපි කියනවා නිරෝධයට පත් උනා කියලා. කොතනින්ද නැවතුනේ? නැවතුනේ, එනම් නිරෝධසමාපත්තියට සමවැදුනා කියන තැනට පත් උනේ නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල සිතින්. නිරෝධ සමාපත්තියට යන්න කලින් සමාධියේ පැයක් ඉන්නවද පැය භාගයක් ඉන්නවද විනාඩි 15 ඉන්නවද කියලා අධිෂ්ඨාන කරන්න ඕන.

අපි මේක විශේෂයෙන්ම අනාගාමීන් වහන්සේ නමකගේ තැනට ගන්න ඕන. හේතුව රහතන්වහන්සේලාට කුසල් සිත් පහළ වෙන්නේ නෑ. දැන් අනාගාමීන් වහන්සේ නමක් නිරෝධ සමාපත්තියට සමවැදෙන කොට කුසල් සිත් පේළිය ගිහිල්ලා නිරෝධ සමාපත්තියට පත් උනා. අපි හිතමු අධිෂ්ඨාන කළ පරිදි විනාඩි 15 ක් නිරෝධ සමාපත්තියේ හිටියා. විනාඩි 15 වකින් සමාධියෙන් මතුවෙනවා. විනාඩි 15 වකින් මතුවෙනකොට මේ අනාගාමීන් වහන්සේගේ හිත ගොඩවෙන්නේ **අනාගාමී ඵල සිතට**. නිරෝධ සමාපත්තියට සමවදින්න පෙර සිත නැවතුනේ **කුසල් සිතක**. නිරෝධ සමාපත්තියෙන් ගොඩ උනේ **අනාගාමී ඵල සිතට. අනාගාමී ඵල සිත කියලා කියන්නේ අව්‍යාකෘත සිතක්.** ඒක නිසා එතැනදිත් කියනවා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා.

හැබැයි මේ කථාව සිද්ධ වෙන්නේ අනාගාමීන්වහන්සේ නමක් නිරෝධ සමාපත්තියට සමවදිනකොට පමණයි. ඒ නිරෝධ සමාපත්තියට සමවදින වෙලාවේ නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත් පෙළේ සිත් දෙකක් හෝ තුනක් ඇතිවෙන කොට ඒ අවසාන සිත එනම් නිරෝධ සමාපත්තියට සමවැදීමට පෙර පහළ වූ අවසාන **නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල සිත තමයි නිරෝධ සමාපත්තියෙන් ගොඩ වෙනකොට අනාගාමී ඵල සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ.** මෙතන gap එකක් තිබෙනවා. දැන් බලන්න මේක හරි ආනුභාව සම්පන්න හිතා ගන්නත් බැරි, කියලා චිත්ත ප්‍රසාදය පහළ කරගන්න ධර්ම සන්ධිස්ථානයක්.

අපි චිත්ත වීථි කථාව කරගෙන යනකොට ඒ වෙලාවේ ඒ ක්ෂණයේ නැතිවෙන්නාවූ සිත ඒ එක්කම පහළ වෙන්නා වූ ළඟම තිබෙන සිතට තමයි අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා කියන්නේ. ඕක අහලා අහලා කන හුරු වෙච්ච අපිට හිතෙනවා අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය සම්පත්තිය ලබන්න ඒ ප්‍රත්‍යය උප්පන්නය ඒ එක්කම ළඟම පහළ වෙන්න ඕන කියලා. **එහෙම අවශ්‍යය නෑ.** මේකේ එහෙම ධර්ම ස්වභාවයක් **නෑ.** ඒක ළඟ එකට වෙන්නත් පුළුවන් gap එකක් සහිත දුර තිබෙන අව්‍යාකෘතයකට වෙන්නත් පුළුවන්. මෙතැන තිබෙන gap එක දුරයි. අනාගාමීන් වහන්සේ විනාඩි 15 සිටියා නම් නිරෝධ සමාපත්තියේ, නේවසඤ්ඤානාසඤ්ඤායතන අවසාන කුසල් සිතෙන් පස්සේ ඒ අනාගාමීන් වහන්සේගේ ඵල සිත පහළ වෙන්නේ විනාඩි 15

කට පස්සේ. එතකොට හරියටම විනාඩි 15 කින් ඒ ඵල සිතට පත්වෙන්න මේ කුසල් සිත අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය ස්වභාවයට පත්වෙනවා. ඒ විසිතුරු කම ඔය විදියට තිබෙනවා.

අපේ පින්වතුන් ඔය වගේ තැන් හොඳට මෙනෙහි කරන්න. ඕක ධර්ම මනසිකාරයක්. මේ විදියට හිත් පහළ වෙනවා ක්‍රියාත්මක වෙනවා කියලා කාමරාගය ව්‍යාපාදය නැති කරපු ආර්යන් වහන්සේ නමකගේ සිත නිවී යන තැනක ක්‍රියාත්මක වෙන විදිය ධර්ම සංඥාවක් හැටියට මේ චිත්ත වීථි ක්‍රමය හරහා අපි මෙනෙහි කරනකොට එතැන ධර්ම මනසිකාරයක් තිබෙනවා. ඕකත් මේ පින්වතුන්ට පිහිට වෙනවා ඔය තැන් වලට යන්න. ඉස්සරකාලේ බණ අහපු නිසානේ ධර්ම අවබෝධ වෙනවා කියන්නේ. අපිට මේක පිහිට වෙනවා.

තව තැනක් අපි හිතමු. අපි හිතමු මෙහෙම. අපි දැන් භාවනා කරනවා. නිරෝධ සමාපත්තිය හරියෙන් පහළට බැහැගෙන බැහැගෙන ඇවිල්ලා අපි විදර්ශනා කරනවා. හොඳට හේතු ඵල ධර්මයන් මෙනෙහි කරනවා. අනිත්‍යය දුක්ඛ අනාත්මය හොඳට මෙනෙහි කරනවා. අනිත්‍යය දුක්ඛ අනාත්ම මෙනෙහි කරගෙන මෙනෙහි කරගෙන යනකොට යනකොට අවසානයේදී සංස්කාර ආරම්මණය වෙලා දුක හෝ අනිත්‍යය හෝ අනාත්ම හෝ වේවා ධර්ම ස්වභාව තුනෙන් එකක් අරමුණු කරගෙන මාර්ග චිත්ත වීථියක් යනවා. ඒ චිත්ත වීථිය 'පරිකර්ම' 'උපචාර' 'අනුලෝම' 'ගෝත්‍රභූ' ඊට පස්සේ 'මාර්ග' 'ඵල'. මේවා ඔක්කෝම කුසල් සිත්. 'පරිකර්ම සිත' කුසල් සිතක්. ඒවාගේම ඒක වැඩක් කරන කාමාවචර කුසල් ජවන් සිතක්. ඒ වැඩේ අනුව තමයි ඒ නම් වැටිලා තිබෙන්නේ. ඊළඟට 'පරිකර්ම' 'උපචාර' 'අනුලෝම' 'ගෝත්‍රභූ'. මේ ටික ඔක්කෝම වෙන වෙන වැඩ කරන සිත් පෙළක්. 'ගෝත්‍රභූ' සිතෙන් පස්සේ තව කුසල් සිතක් තිබෙනවා. ඒ තමයි **'ලෝකෝත්තර මාර්ග සිත'**. සෝවාන් වෙන වෙලාවේදී ඒ ලෝකෝත්තර මාර්ග සිත කියන කුසල් සිත පහළ වෙච්ච ගමන් ඒ එක්කම පහළ වෙන්නේ **ඵල සිත**. හැබැයි **ඵල සිත** කුසල් සිතක් නොවෙයි. **ඒක අව්‍යාකෘතයක්. මාර්ග සිත කුසල් සිතක්.** ඒක නිසා මෙතැනට ගලපනවා මේ ධර්මය = **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා. **'සෝවාන් මාර්ග සිත'** නම් වූ **'කුසල් සිත' 'ඵල සිත'** කියන්නා වූ **'අව්‍යාකෘත ධර්මයට'** අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන ධර්මය මේ කථාවට ගැලපෙනවා.

ඒ විදියටම යම් කිසි කෙනෙක් සකෘදාගාමි වෙනවා. **'සකෘදාගාමි මාර්ගය කියන්නා වූ කුසල් සිත' 'සකෘදාගාමී ඵලය'** නම් වූ **'අව්‍යාකෘතයට' 'අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා'** = **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො**

අනාගාමී වෙනකොට **'අනාගාමී මාර්ගය නම් වූ කුසල් සිත' 'අනාගාමී ඵල සිත'** නම් වූ **'අව්‍යාකෘතයට' 'අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා'**. එතකොටත් කියනවා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො'** කියලා.

රහත් භාවයට පත්වෙනකොට **'රහත් මාර්ගය නම් වූ කුසල් සිත' 'රහත් ඵල සිත නම් වූ අව්‍යාකෘතයට' 'අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා'**. එතකොටත් කියන්නේ **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො**කියලා.

දැන් තේරෙනවනේද **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන තැන හොඳට අපිට ඒ උත්තම ස්වාමීන්වහන්සේලා කියලා ගලපලා වටහලා දීපු විදිය. ඔය ටික අපි ඔය විදියට තේරුම් ගනිමු. තේරුම් අරගෙන අපි තවත් පැත්තක් හිතමු බලන්න.

ඒ තමයි සෝවාන් වෙච්ච එක්කෙනා 'මම දැන් සෝවාන් උනා. මගේ වැඩ ඔක්කොම හරි. මම දැන් බාහිර කටයුතු වලට යනවා' කියලා එහෙම යන්නේ නෑ. එයාට බාහිර වැඩ අඩුවෙනවා. සෝවාන් වෙච්ච එක්කෙනා ඉස්සරවෙලා කර කර හිටපු සමාජ වැඩ කටයුතු ගෙවල් දොරවල් වල කටයුතු අවශ්‍යම දේ පමණක් කරනවා, ගොඩක් වැඩ අඩු වෙනවා. ඒක තමයි හැටි. සමහර වෙලාවට වර්තමානයේ සෝවාන් උනාය කියන අයගේ වැඩ වැඩියි. ස්වභාවයෙන්ම සෝතාපන්න භාවයට පත් උනහම ඒ සෝතාපන්න ආර්යයා අවශ්‍යම කළ යුතු දේවල් වලට යොමු වෙනවා ඇරෙන්න අනිත් ඒවා අඩුකරනවා. ඒක ධර්ම ස්වභාවයක්. එයාගේ වැඩ අඩුවෙනවා. සකෘදාගාමී

උනාට පස්සේ තවත් අඩුවෙනවා. අනාගාමී උනාට පස්සේ තවත් අඩුවෙනවා. රහතන්වහන්සේ ජීවිත පැවැත්ම පමණයි කරන්නේ. පිණ්ඩපාතය කරගන්නවා. වත පිළිවෙතක් කර ගන්නවා. ඊට වඩා දෙයක් කරන්නේ නෑ.

මේ සෝවාන් වෙච්ච උත්තමයෝ බාහිර කටයුතු කාරණා අඩු උනහම ඒ අවබෝධ කරගත්ත නිවන් සුවය විඳින්නට පෙළඹෙනවා. ඒ ඵල සිත් මාර්ගයෙන් නිර්වාණය අරමුණු කරගෙන නිවන් සැප විඳින්නා වූ ඒ ක්‍රමයට කියනවා ඵල සමාපත්ති ක්‍රමය කියලා.

සෝවාන් වෙච්ච ආර්යන් වහන්සේ සෝවාන් ඵල සමාපත්තියට පත්වෙනවා. සකෘදාගාමී වෙච්ච ආර්යන් වහන්සේ සකෘදාගාමී ඵල සමාපත්තියට පත්වෙනවා. අනාගාමී ආර්යන් වහන්සේ අනාගාමී ඵල සමාපත්තියට පත්වෙනවා. රහතන්වහන්සේ අරහත්ඵල සමාපත්තියට පත්වෙනවා.

අපි හිතමු කෙනෙක් උදේ පාන්දර හයට විතර හිරු උදාවේගෙන එන කොට භාවනා කරලා භාවනා කරලා සෝවාන් මාර්ග ඵල අවබෝධ කරගත්තා කියලා. එතකොට මේ විග්‍රහයට අනුව උදේ පාන්දර මාර්ග ඵල අවබෝධ කරගන්න වෙලාවේදී **'මාර්ග සිත' නම් වූ කුසල් සිත 'ඵල සිත'** කියන්නා වූ **අව්‍යාකෘතයට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම** සිදු උනා.

ඊළඟට හැන්දෑවේ හයට විතර බුද්ධ වන්දනාව එහෙම කරලා උදේ විඳපු නිවන් සුවය නැවත අරමුණු කිරීම් වශයෙන් විනාඩි පහකට විතර ඒ නිවන අරමුණු කරන්න යනවා. ඒ වෙලාවේදී සංස්කාර අරමුණු කරගෙන මුලින්ම නිවන් දකින්න උදේ භාවනා කරනකොට ඇති වූ ඒ 'පරිකර්ම' 'උපචාර' 'අනුලෝම' 'ගෝත්‍රභූ' කියන විදියට ආපු ඒ පිළිවෙල හැන්දෑවේ ඵල සමාපත්තියට පත්වෙනකොට 'අනුලෝම' 'ගෝත්‍රභූ' 'මාර්ග' 'ඵල' කියලා පත් වෙන්නේ නෑ. හැන්දෑවේ විදර්ශනා කරගෙන යනකොට (ඒ වෙලාවේත් යම් කිසි පරිකර්මයක් කළ යුතුයි. මනසිකාරයක් පැවැත්විය යුතුයි) ඒ වෙලාවේ දී සංස්කාර ආරම්මණය කරගෙන ඵල සිතට අනුකූලව පහළ වෙන අනුලෝම නම් වූ කුසල් සිත පහළ වෙනවා. මේ අවස්ථාවේදී ගෝත්‍රභූ සිතක් පහළ වෙන්නේ නෑ. ගෝත්‍රභූ සිත පහළ උනේ උදේ සෝවාන් වෙන වෙලාවේදී.

දැන් ඉන්නේ සෝවාන් වෙච්ච කෙනා. මේ අවස්ථාවේදී අනුලෝම සිතට පස්සේ ගෝත්‍රභූ සිත පහළ වෙන්නෙත් නෑ. අනුලෝම සිතට පස්සේ මාර්ග සිතක් පහළ වෙන්නෙත් නෑ. හැන්දෑවේ සමාපත්තියට සමවදිනකොට ඒ ආර්යන් වහන්සේට පහළ වෙන්නේ **'අනුලෝම සිතෙන්'** පස්සේ **'ඵල සිතයි'. 'අනුලෝම සිත'** කියලා කියන්නේ **'කුසල් සිතක්'. 'ඵල සිත'** කියලා කියන්නේ **'අව්‍යාකෘත සිතක්'.** ඒක නිසා මේ චිත්ත වීථිය විග්‍රහ කරනකොට ධර්මය දැකපු ඒ ආර්යන් වහන්සේලා ඒ ගුණ ඇති ස්වාමීන්වහන්සේලා අපිට **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියලා හොඳට මේ සමාපත්තියේදීත් ගලපලා දෙනවා. ඔය විදියට අපිට **අනන්තර ප්‍රත්‍යය** පිළිබඳව ලස්සනට ඉතාමත්ම හොඳ විදියට විස්තර කරනවා. සෝවාන් ආර්යන් වහන්සේට ඔය විදියට සිදුවෙනවා.

සකෘදාගාමී ආර්යන් වහන්සේට සකෘදාගාමී ඵල සමාපත්තියට පත්වෙන කොට පහළවෙන **'අනුලෝම සිත'** නම් වූ **'කුසල ධර්මය' 'ඵල සිත නම් වූ අව්‍යාකෘතයට' 'අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා'** කියන කථාව ලස්සනට විස්තර කරලා දෙනවා.

අද මේ පින්වතුන්ට මම මතක් කළේ **අනන්තර ප්‍රත්‍යය** යටතේ තිබෙන වීථි ක්‍රම හතෙන් දෙවෙනි වීථිය. ගිය වතාවේ කිව්වේ 'කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො' කියන කථාව. අද කිව්වේ **'කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො'** කියන වීථි විග්‍රහය. තව තිබෙනවා ඉස්සරහට. අකුසල ධර්මයක් අකුසල ධර්මයට මතුවෙන තාලේ ඉස්සරහදි කියනවා. ඒක තුන්වෙනි අවස්ථාව. අපි ඉදිරියේදී ඒකත් මතු කරගනිමු.

පොත කියවලා ඉවර වෙනවාට වඩා එක ධර්ම කාරණයක් හෝ වේවා හිතේ පැලපදියන් කර ගැනීම ධර්ම මනසිකාරයට භාවනා මනසිකාරයට මහා උපකාරයක් උතුම් උපකාරයක් වෙනවා. ඔය විදියටම ධර්ම මෙනෙහි කරලා රහතන්වහන්සේගේ හිත මෙහෙම නේද උනේ, අනාගාමීන් වහන්සේගේ සිතට මෙහෙම නේද උනේ කියලා උන්වහන්සේලාගේ ඒ චිත්ත ක්‍රියාකාරීත්වයම ශාන්ත වූ සමාධිමත් වූ ප්‍රඥාවෙන් පිරී ගියාවූ සිතකින් දැනගෙන, ශ්‍රද්ධාව මතුකරගෙන නැත්නම් ප්‍රඥාව මතු කරගෙන ශ්‍රද්ධාවෙන් පැහැදිලා ඒ පැත්තට

යන්නත් පුළුවන්, ප්‍රඥාවෙන් මතුවෙලා ඉස්සරහට යන්නත් පුළුවන්. ඒක නිසා මේක අපි මේ විදියට මෙනෙහි කිරීම පිහිටක් වෙනවා. ශාන්තියක් වෙනවා. ඒවාගේම විශාල ධර්මමය මහෝපකාරී ස්වභාවයක් වෙනවා. අද මේ පින්වතුන්ට මම හිතනවා මේ ටික තේරෙන්න වැටහෙන්න ඇති කියලා. තවත් මොනවා හරි දෙයක් තිබෙනවා නම් ඉස්සරහදි අපිට සාකච්ඡා කරන්න පොඩි කාලයක් ගමු.

මේ පින්වත් සැම දෙනාටම ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ ඥානයෙන් පිරිච්ච සමාධියෙන් පිරිච්ච සීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් වැඩිච්ච ඒ අනන්ත ගුණ ඇති බුදුරජාණන්වහන්සේගේ සරණ වේවා! පිහිට වේවා! ඒ උතුම් වූ ධර්මයේ සරණ පිහිට වේවා! ඒ ධර්මයට අනුයාතව සිත යොදලා ධර්ම මාර්ගයේ ගමන් කළ ආර්ය ශ්‍රාවකයන් වහන්සේලාගේ මහා සංඝරත්නයේ සරණ වේවා! මේ පින්වත් සැම දෙනාටම එක තැනක නිස්කලංකව ඉඳගෙන මේ ආර්යන් වහන්සේලා ස්පර්ශ කරපු මේ ධර්ම කොට්ඨාස මේ ධර්ම කාණ්ඩ වලට මේ ධර්ම සන්ධිස්ථාන වලට වන්දනා ගමනක් යන්නාක් මෙන් නුවණින් මේ ස්ථාන වලට ගමන් කරලා **අනන්තර ප්‍රත්‍යයයේ** තිබෙන්නාවූ මේ ධර්ම ස්වභාවය, ඊළග ධර්මයට අනන්තර ප්‍රත්‍යය වැටිච්ච විදිය, ප්‍රත්‍යය ධර්මය සහ ප්‍රත්‍යය උප්පන්න ධර්මය ආර්යන් වහන්සේලා දැකපු විදියටම දැකගෙන බලාගෙන වටහාගෙන සැමදෙනාටම ඒ අනන්තර ප්‍රත්‍යය ස්වභාවයක් නැති ශාන්ත වූ සුවදායක වූ නිවීමෙන් පිරීගියා වූ කිසිම දවසක නැවත අනන්තර ප්‍රත්‍යය සිද්ධ කරන තැනකට ගොඩ නොවෙන්නා වූ ශාන්ත වූ නිර්වාණ ධාතුව අවබෝධ වේවා! සැම දෙනාටම මේ ධර්ම මනසිකාරය ඒ උතුම් වූ සියුම් වූ ශාන්ත වූ පවිවේකී වූ සියුම් පවිවේකයෙන් පිරීගියා වූ නිර්වාණ ධාතුව ස්පර්ශ කිරීම පිණිසම හේතු වාසනා වේවා! කියලා මම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

<u>ප්‍රශ්නයක් </u>- තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස මාර්ග සිතට පස්සේ ඇතිවෙන ඵල සිතට ආනන්තරික සමාධිය කියලා කියනවා. ඒකමද මෙතන අනන්තර ප්‍රත්‍යය කියලා කියන්නේ?

<u>පිළිතුර</u> - ආනන්තරික සමාධියයි අනන්තර ප්‍රත්‍යයයි කියන්නේ විග්‍රහාත්මක ධර්ම ක්‍රම දෙකක්. අනාන්තරික සමාධිය කියලා කියන්නේ ඒ සිතේ තිබෙන්නාවූ සමාධි ගුණය. ඒ කියන්නේ හිතක පහළ වෙනවා චිත්ත

ඒකාග්‍රතාවයක්. ඒ චිත්ත ඒකාග්‍රතාවය මුල් කරගෙන කථා කරන විග්‍රහය සහ ඒකට තමයි ආනන්තරික සමාධිය කියලා කියන්නේ. අනන්තර ප්‍රත්‍යය කියලා කියන්නේ ඒකම නොවෙයි. අනන්තර ප්‍රත්‍යය කියන එක මාර්ග සිත සහ ඵල සිත අතරත් සිද්ධ වෙනවා. අනන්තර ප්‍රත්‍යය වෙනත් සාමාන්‍ය ලෞකික සිතකත් භවාංග සිතකත් සිද්ධ වෙනවා. ඒක නිසා මේ අනන්තර ප්‍රත්‍යය කියන ප්‍රත්‍යය විභාගය, ඒ විග්‍රහය අරකට නැත්තේ නෑ. නමුත් මේක වෙන විදියකට කරන්නා වූ ප්‍රත්‍යය, ප්‍රත්‍යය උප්පන්න ධර්මයන් පිළිබඳව වෙනම කථාවක්. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නයක් </u>- ගෞරවණීය ස්වාමීන්වහන්ස අවසරයි. කෙටි පැහැදිලි කිරීමක් කරලා දෙන්න පුළුවන් නම් හොඳයි. රූපාවචර සහ අරූපාවචර කුසල අන්තිම ජවනය කොහොමද අනන්තර ප්‍රත්‍යයෙන් අව්‍යාකෘතයකට ප්‍රත්‍යය වෙන්නේ කියලා. ඒක ගැන පොඩි පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි ස්වාමීන්වහන්ස. මෙතන එකක් ගත්තොත් 'පංචවෝකාර භවාංග නමයට ප්‍රත්‍යය වෙන රූපාවචර කුසල අන්තිම ජවනය' කියලා තිබෙනවා. ඒ වගේ තවත් විස්තර වගයක් තිබෙනවා. ඒ ගැන පොඩ්ඩක් පැහැදිලි කරගන්න පුළුවන්ද ස්වාමීන්වහන්ස? තෙරුවන් සරණයි!

<u>පිළිතුර </u>- මම හිතනවා අපේ පින්වතුන්ට පංචවෝකාරයේ කථාව කියන කොට එතැන භවාංග තේරුම් ගත්තොත් හොඳයි කියලා. ඒ කියන්නේ තදාරම්මණ වැඩේ සිද්ධ වෙන තැනක් නෑ ඔතන. භවාංග යන්නේ. මෙතැන තිබෙනවා භවාංග නමයක් කියලා. අපේ පින්වතුන් භවාංග නමය තේරුම් ගන්න. අපි ඉන්නේ පංචවෝකාරයේ, ඇඟක් හිතක් වේදනාවක් එහෙම තිබෙන. අපි දැන් භාවනා කරනවා. කුසල් සිත් අටක් තිබුණාට ඒ කුසල් සිත් අටම ඔය භාවනාවේ යෙදෙන්නේ නෑ. කාමාවචර කුසල් සිත් වලින් 4 කින් භාවනා කරන්න පුළුවන්. හතරකින් භාවනාවක් කරන්න බෑ, වෙන මොනවා හරි ටිකක් කරන්න පුළුවන්. භාවනාවක් කරන්න නම් අවශ්‍යයි **සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත** සහ **සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංඛාරික සිත** කියන ඥාන සම්ප්‍රයුක්ත සිත් දෙක. ඒ සිත් දෙකෙන් පුළුවන්. ඥාන විප්‍රයුක්ත සිත් දෙකෙන් ඔය වැඩේ කරන්න බෑ.

ඊළඟට යන්න ඕන උපේක්ඛා සහගත සිත් දෙකට. **උපේක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත** සහ **උපේක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංඛාරික**

**සිත** කියලා සිත් දෙකක් තිබෙනවා. භාවනා කරනකොට ඔය කියන්නා වූ සිත් හතර තමයි **ත්‍රිහේතුක** නිසා ඉදිරිපත් වෙන්නේ. ඒවායෙන් තමයි භාවනා කරන්න පුළුවන් කම තිබෙන්නේ. ඔය එකක්.

අනිත් එක තමයි, ඉස්සරහට යන කොට ඒ කියන්නේ රූපාවචර ධ්‍යාන තිබෙනවා 5 ක්. ඒ ධ්‍යාන වැඩ කරන හැම සිතක්ම ත්‍රිහේතුකයි. කවදාකවත් රූපාවචර ධ්‍යානවල ද්විහේතුක ඒවා නෑ. ඒවා ත්‍රිහේතුකයි. ඒකෙ බෙදීම තිබෙන්නේ තීක්ෂණ සහ මන්ද කියන භාවය පමණයි. නුවණේ අඩු වැඩි භාවය පමණයි. නමුත් නුවණ තිබෙන්න ඕනෑ.

දැන් ධ්‍යාන ක්‍රමයෙන් ගත්තොත් එහෙම තිබෙනවා නේද මෙතැන නමයක්? අරූපාවචර ගත්තොත් එහෙම ඒකෙත් එහෙමයි. අරූපාවචරයේ තිබෙන්නේ සම්පූර්ණයෙන්ම උපේක්ඛා සහගත ස්වභාවයක්. දැන් අපි හිතමු මෙහෙම. ආකාසානඤ්චායතන කුසල් සිත වඩනවා. එතකොට කුසල් සිත් පේළියක් යනවා . ඒ පේළිය ගිහිල්ලා අවසානයේදී ඒ කුසල් සිත කැඩෙන තැනින් පස්සේ ආකාසානඤ්චායතන කුසල ජවනය ඉවර උන ගමන් ඇතිවෙන්නේ භවාංගයක්. ඒ භවාංගය **අව්‍යාකෘතයක්.** ඒක නිසා කියනවා **ආකාසානඤ්චායතන කුසල අන්තිම ජවනයෙන් පස්සේ ප්‍රත්‍යය ස්වභාවය ලබන්නේ භවාංග සිත කියලා.** ඒක නිසා **කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො** කියන එක එතන සිද්ධ වෙනවා.

අපි මෙහෙම හිතමු. අපි උපදින කොට ඥාන සම්ප්‍රයුක්ත සිතකින් උපන්නා වූ කෙනෙකුගේ විතරයි ඥාන සම්ප්‍රයුක්ත භවාංගයක් තිබෙන්නේ. ඥාන විප්‍රයුක්ත සිත්වලින් ඉපදුන අයට ඕක සිද්ධ වෙන්නේ නෑ. සිද්ධ වෙන්නේ නැත්තේ, ඥාන විප්‍රයුක්ත කියන්නේ ද්විහේතුක කුසල් සිත්. ඒ ගොල්ලන්ට මේ කථාව ගැලපෙන්නේ නෑ කියලා කියන්නේ ඒ ගොල්ලන්ට ධ්‍යාන උපදවන්න අමාරුයි. ඒක නිසා තමයි ත්‍රිහේතුක භවාංගම මෙතනට ගලපන්නේ සහ මෙතන කියන්නේ. දැන් ද්විහේතුක එක්කෙනාගේ තිබෙන්නේ හේතු දෙකයි. එතකොට කෙනෙකුට හිතන්න පුළුවන් ද්විහේතුක එක්කෙනා භාවනා කරලා ධ්‍යාන ලැබුවොත් ඒ ධ්‍යාන ලබපු එක්කෙනා ධ්‍යාන සමාපත්තියකින් එහා පැත්තේදී භවාංග වෙනකොට ද්විහේතුක භවාංගට යන්නේ. මෙතන ඒක යොදන්නේ නැත්තේ මේ ද්විහේතුකයාට ඒ ධ්‍යාන කුසලය ඇති කරන්න බෑ.

ඒක නිසා තමයි කියන්නේ ඥාන සම්ප්‍රයුක්ත කුසලයකින්ම ඕනෑ උපදින්න. ඥාන සම්ප්‍රයුක්ත කුසලයකින් ඉපදුන එක්කෙනාගේ භවාංගය ත්‍රිහේතුක භවාංගයක්. එතකොට තමයි ඔය කියන්නා වූ රූපාවචර කුසල අන්තිම ජවනය ත්‍රිහේතුක භවාංගයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියන කථාව කියන්නේ. මේක තේරෙන්න ඇති කියලා මම හිතනවා. තෙරුවන් සරණයි!

<u>මහත්මයෙක්</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස එතැන කියවෙනවා ආකාසානඤ්චායතන කුසල අන්තිම ජවනය ප්‍රත්‍යය වෙනවා කියලා පංචවෝකාර ත්‍රිහේතුක භවාංග නමයට හා ආකාසානඤ්චායතන භවාංගයට. එතකොට එතන ත්‍රිහේතුක භවාංග නමය හැටියට ගන්නේ ත්‍රිහේතුක මහා විපාක සිත් 4 ත් ඊළඟට රූපාවචර විපාක 5 ත් කියලා හිතනවා. ඒක කොහොමද ස්වාමීන්වහන්ස ආකාසානඤ්චායතන භවාංගට ප්‍රත්‍යය වෙන්නේ කියන එක පොඩ්ඩක් පැහැදිලි කරගන්න පුලුවන්ද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඉස්සෙල්ලා බලන්න ඕන ආකාසානඤ්චායතන භවාංගයක් වෙන්නේ කොහොමද කියලා. ආකාසානඤ්චායතන භවාංගයක් වෙන්න නම් ආකාසානඤ්චායතනයේ උපදින්න ඕන.

<u>මහත්මයෙක්</u> - එතන ඉපදිලා ආකාසානඤ්චායතන කුසලය වැඩීමක් සම්බන්ධයෙන් කියවෙනවා වගේ හිතෙනවා. එහෙමද ස්වාමීන්වහන්ස මෙතැන කියන්නේ?

<u>පිළිතුර</u> - මේකට ගලපුවහම ආකාසානඤ්චායතනයේ ඉඳලා ඊළඟ ඉස්සරහ සිත වඩන කොට සිදුවෙන සිදුවීම තමයි කියන්නේ. නැත්නම් ආකාසානඤ්චායතන භවාංගයක් වෙන්නේ නෑ. පංචවෝකාර භවය ආකාසානඤ්චායතන භවාංග සිද්ධ වෙන තැනක් නොවෙයි. ආකාසානඤ්චායතන භවාංගයක් වෙන්න නම් එතෙන උපදින්න ඕන. යම් කිසි විදියකින් ආකාසානඤ්චායතනයේ උපන්නා වූ කෙනා ආකාසානඤ්චායතනයම අරමුණුකරගෙන ඒ ධ්‍යානයම වඩලා එයාගේ ඒ ආකාසය අරමුණු කරමින් තිබුණ කුසල් සිත නවතින තැන තමයි ආකාසානඤ්චායතන භවාංගය.

අපි උපදිනවා කුසල් සිතකින් මෙහෙ. ඒ කියන්නේ අපි මීට පෙර කළා වූ ඥාන සම්ප්‍රයුක්ත වූ කුසල් සිතකින් අපි මෙහෙ ප්‍රතිසන්ධිය ගන්නවා. ඊට අනතුරුව අපිට පහළ වෙන්නා වූ භවාංග සිතත් ඥාන සම්ප්‍රයුක්තයි. අපි දැන් මෙහෙත් කුසල් වඩනවා. ඒවා අපි ඥාන සම්ප්‍රයුක්තව සිද්ධ කරනවා. ඥාන සම්ප්‍රයුක්තව අපි මේ කරන්නා වූ පිනක චිත්ත වීථියක් ගිහිල්ලා නවතිනවා භවාංගයක. ඒ භවාංගයත් ඇවිල්ලා ඥාන සම්ප්‍රයුක්ත හොඳ කුසලයක්.

රූපාවචරයෙත් එහෙමයි. රූපාවචර ලෝකයක පහළ වෙච්ච එක්කෙනාට තිබෙන්නේ ඥාන සම්ප්‍රයුක්ත හොඳ භවාංගයක්. ඒ රූපාවචර බ්‍රහ්මලෝකයේ ඉන්න එක්කෙනා බණත් අහලා ඊට පස්සේ තවත් කරන්න තිබෙන භාවනාවල් කරගෙන ගිහිල්ලා ඒ චිත්ත වීථි ගිහිල්ලා අවසාන ජවනයෙන් පස්සේ එයාගේ හිතත් වැටෙනවා භවාංගයට. භවාංගයට වැටෙනකොට ඒකත් හොඳ මෝරපු ත්‍රිහේතුක කුසල් සිතකින් හදලා දීපු භවාංගයකට තමයි යන්නේ. එතකොට එතනත් සිද්ධ වෙනවා භවාංග ගත වීම.

ආකාසානඤ්චායතනයේ ඉපදුන එක්කෙනාට ඒ හිත භවාංග වෙනවා. එයා නැවත චිත්ත වීථි පහළ කරලා ඒකෙ කෙළවර භවාංග ගතවෙනවා.

<u>මහත්මයෙක්</u> - තෙරුවන් සරණයි බොහොම පින් ස්වාමීන්වහන්ස. මෙතන තව එකක් තබෙනවා. විඤ්ඤාණඤ්චායතන භවාංගයට ප්‍රත්‍යය වෙන විඤ්ඤාණඤ්චායතන කුසල අන්තිම ජවනය කියලා. දැන් අපි හිතුවොත් එහෙම ආකාසානඤ්චායතනයේ ප්‍රතිසන්ධිය ගත්ත කෙනෙක් විඤ්ඤාණඤ්චායතනය වඩනවා නම් එතනදී ඇති වෙන්නේ විඤ්ඤාණඤ්චායතනය අවසාන ජවනයට පස්සේ ආකාසානඤ්චායතනය භවාංග සිත කියලා වගේ හිතුවොත් නිවැරදිද ස්වාමීන්වහන්ස. ඒක මෙතන සඳහන් නොවෙන්න විශේෂ හේතුවක් තිබෙනවද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - හොඳ තැනක් තිබෙනවා ඔතන. මේ කථාව තිබෙන්නේ වෙන විදියකට. ආකාසානඤ්චායතන කුසල අන්තිම ජවනය ආකාසානඤ්චායතන අන්තිම භවංගයට ප්‍රත්‍යය වෙනවා කියලා කියන්නේ. එතකොට විඤ්ඤාණඤ්චායතන කුසලයේ අන්තිම ජවනය විඤ්ඤාණඤ්චායතන

භවාංගයට ප්‍රත්‍යය වෙනවා කියලා. ආකිඤ්චඤ්ඤායතන කුසලයේ අන්තිම ජවනය ආකිඤ්චඤ්ඤායතන භවාංගයට ප්‍රත්‍යය වෙනවා කියලා. එතකොට බලන්න ඕනෑ ආකාසානඤ්චායතනයේ ඉපදිච්ච කෙනා විඤ්ඤාණඤ්චායතන කුසලය වැඩුවොත් අවසාන ජවනය වෙන්නේ විඤ්ඤාණඤ්චායතන කුසලයට පස්සේ ආකාසානඤ්චායතන භවාංගයයි. එහෙම යන කථාවක් තිබෙනවද? රූපාවචර ධ්‍යාන වගේ ආකාසානඤ්චායතනයේ ඉඳලා ඊට පස්සේ විඤ්ඤාණඤ්චායතනය. විඤ්ඤාණඤ්චායතනයේ ඉඳලා ආකිඤ්චඤ්ඤායතනය. ආකිඤ්චඤ්ඤායතනයේ ඉඳලා නේවසඤ්ඤානාසඤ්ඤායතනයේ ඉපදීලා එහෙම යනවා කියලා එහෙම තිබෙනවද? පංචවෝකාරයේ ඉඳලා හදාගෙන ගියාවූ ශක්තිය තමයි එතනදී හුදකලාව ක්‍රියාත්මක වෙන්නේ. ඒක නිසා මේකේ කියන්නේ නෑ ආකාසානඤ්චායතනයෙන් ගැලවිලා එතන ඉඳලා විඤ්ඤාණඤ්චායතනය වඩාගෙන ඊට පස්සේ විඤ්ඤාණඤ්චායතනයේ උපදිනවා කියලා. එහෙම උනොත් එහෙම මේ කථාව අනිත් පැත්තට යනවා. ආකාසානඤ්චායතනය වඩන්නේ මෙහෙ ඉඳලා. මෙහෙ ඉඳලා ආකාසානඤ්චායතනය වඩලා එහෙට ගියාට පස්සේ එතනදී සිද්ධ වෙන කථාව තමයි මේ කියන්නේ.

රූපාවචර ලෝකවල තිබෙනවා ස්වභාවයක්, රූපාවචර දිව්‍යලෝකයේ පවා එහෙන් තවත් එහෙකට යන්න පුළුවන්. රූපාවචර ප්‍රථම ධ්‍යානය තලයේ සිටින කෙනෙක් හිත හොඳට හිත දියුණු කරලා ඉහළ එකට යන්න පුළුවන්. එතනින් තව ඉහළ එහෙකට යන්න පුළුවන්. ආකාසානඤ්චායතනය වඩාගෙන මෙහෙ ඉඳලා එහෙ යන්න පුළුවන්කම තිබෙනවා. නමුත් එහෙ ඉඳලා වඩාගෙන ඉහළ තල වලට යන ඒවා කියන්නේ නෑ.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස, එතකොට අපි ආකාසානඤ්චායතන භූමියේ ප්‍රතිසන්ධිය අරගෙන එයාට කොයි විදියේ භාවනාවක් වගේද එතකොට කරන්න පුළුවන් වෙන්නේ ස්වාමීන්වහන්ස. ආකාසානඤ්චායතනයෙන් චුත වෙලා එතනින් ඉහළ තලයක ප්‍රතිසන්ධිය ගන්න හැකියාවක් නැහැ කියන එකද ස්වාමීන්වහන්ස ඒකෙන් විස්තර වෙන්නේ?

<u>පිළිතුර</u> - ආකාසානඤ්චායතනයට ගියැන් පස්සේ මේ විග්‍රහයේ තිබෙන්නේ එතනින් එහාට වෙන භාවනාවක් කරන්නේ නෑ කියලා. අපි හිතමු එයා විඤ්ඤාණඤ්චායතන කුසලය වැඩුවා කියලා. විඤ්ඤාණඤ්චායතන කුසලය

වැඩුවොත් එහෙම එතකොට තිබෙන්නේ විඤ්ඤාණඤ්චායතන කුසලයේ අන්තිම ජවනයට පසුව ආකාසානඤ්චායතන භවාංගයට යනවා කියලා. නමුත් ඒක නොවෙන හින්ද තමයි ආකාසානඤ්චායතන කුසලය ආකාසානඤ්චායතන භවාංයෙන්ම කෙළවර වෙන්නේ.

ධර්ම ස්වභාවයක් හැටියට ආර්යන් වහන්සේලාට එතැනදී සිද්ධ වෙන්න පුලුවන් ධර්ම අවබෝධයක්. ඒකත් බොහොම කලතුරකින් වෙන බව තැන් තැන්වල සඳහන් වෙනවා. බහුලව නොවෙයි. ආර්යන් වහන්සේ නමක් එතැන ඉපදුනොත් ඒ ආර්යන් වහන්සේ උපදින්නෙත් ධ්‍යාන සිතේ කුසලයකින් මිස ආර්ය සිතේ බලයකින් නොවෙයි. එතකොට ඒ ආර්යන්වහන්සේටත් ධ්‍යාන කුසලය කෙලවර වෙන්නේ භවාංග සිතකින්මයි.

රූපාවචර පංචවෝකාරයේ වගේ ආකාසානඤ්චායතනයෙන් විඤ්ඤාණඤ්චායතනයට වැනි ධ්‍යාන ලෝක වලින් ලෝක වලට පැනගෙන යන එකක් උප්පත්ති වශයෙන් කියන්නේ නෑ. එයා ඒ ආකාසානඤ්චායතනයට ගිය කාලය කල්ප 20,000 ඉවර උනාට පස්සේ ආයිමත් එතනින් වෙන එකක් කරගෙන ඊළඟට එකට යන්න ඕනෑ කියලා එහෙම ස්වභාවයක් නෑ. එයා ඊට පස්සේ return වෙනවා.

තව එකක් තමයි මහත්මයා මෙතන අපි වරද්දගත්තු තැනකුත් තිබෙනවා. අපි අහලා තිබෙන ධර්ම පරාසය වැඩියි. කියන ධර්මය එකයි. ඒ කියන්නේ අපි ආකාසානඤ්චායතනය ගැන අහලා තිබෙනවා. රූපාවචරය ගැන අහලා තිබෙනවා. කාමාවචරය ගැන අහලා තිබෙනවා. ඔක්කොම අපි තැන් තැන් වලින් අහලා තිබෙන ධර්ම කාරණා පරාසය වැඩියි. නමුත් අද මේ මාතෘකාව අපිට අමතක වෙනවා. මාතෘකාව තමයි අනන්තර ප්‍රත්‍යය. කුසල ධර්මයක් කොහොමද අව්‍යාකෘත ධර්මයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ කියලා. එතකොට ඒ මාතෘකාව යට යනවා අරක උඩට ආවට පස්සේ. තව තිබෙනවා ඉස්සරහදි කියන්න කොටසක්. අපි එතනත් ගිහිල්ලා බලමු.

<u>මහත්මයෙක්</u> - බොහොම පින් ස්වාමීන්වහන්ස. ඇත්තටම හිතුනේ ඒවගේ අරූපී ධ්‍යානයක් වැඩුවට පස්සේ ඒ චිත්ත වීථිය අවසාන වෙනකොට නැවතත් තමාගේ භවාංග සිත මතු වෙනවා කියලා. ඒකයි ඒ විදියට ප්‍රශ්නය ඇහුවේ ස්වාමීන්වහන්ස. එතකොට මෙතනදී තව කරුණක් දැන ගන්න කැමතියි ස්වාමීන්වහන්ස. පංචවෝකාර ත්‍රිහේතුක භවාංග නමයට ප්‍රත්‍යය වෙනවා කියනවා රූපාවචර කුසලයේ අන්තිම ජවනය. එතකොට අරූපාවචර කුසල අන්තිම ජවනයත් ඒ ටිකටම ප්‍රත්‍යය වෙනවානේද කියලා හිතුන ස්වාමීන්වහන්ස. ඒ කියන්නේ යම්කිසි යෝගියෙක් විඤ්ඤාණඤ්චායතන කුසලය වඩනවානම් ඒ චිත්ත වීථිය අවසන් වෙන්නෙත් භවාංගයෙන් නිසා එතකොට අරූපාවචර කුසල අන්තිම ජවනය ත්‍රිහේතුක භවාංග නමයට ප්‍රත්‍යය වෙනවා කියලා හිතන්න බැරිද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඒක හොඳයි අපි අව්‍යාකෘත කාණ්ඩය කථා කරමුද මහත්තයා? මේකේ වීථි හතක් තිබෙනවා. අපි ගිය පාර කථා කළේ කුසල ධර්මයක් කුසල ධර්මයකට ප්‍රත්‍යය වෙන ආකාරය. අද කිව්වේ කුසල ධර්මයක් අව්‍යාකෘතයකට ප්‍රත්‍යය වෙන තැන. තව තිබෙනවා අකුසල ධර්මයක් අකුසල ධර්මයකට ප්‍රත්‍යය වෙන තැන. අව්‍යාකෘතයක් අව්‍යාකෘතයකට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන තැන. අව්‍යාකෘතයක් කුසලයට ප්‍රත්‍යය වෙන තැන. අව්‍යාකෘතයක් අකුසලයට හොකොමද ප්‍රත්‍යය වෙන්නේ කියලා. ආන්න අපි එතෙන්දි සාකච්ඡා කරමු.

<u>මහත්මයෙක් </u>- ස්වාමීන්වහන්ස සමාවෙන්න දැන් විඤ්ඤාණඤ්චායතනයට වැනි ධ්‍යානයකට පත් වෙලා ඒ සිත් පේළිය ඉවර වෙන්නේ දැනට ඉන්න තත්වයේ භවාංග සිතකින් නිසා කුසලයක් අව්‍යාකෘතයකින් කෙළවර වෙන හින්දයි ඒ ප්‍රශ්නය මම ඇහුවේ ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර </u>- ඒක ගැලපෙනවා. අපි භවාංග නමයක් කිව්වනේ. භවාංග නමයෙන් කෝකට හරි යනවා.

<u>මහත්මයෙක් </u>- එහෙමයි ස්වාමීන්වහන්ස මෙතන ඒක විශේෂයෙන් කියන්නේ නැති හින්දයි ඇහුවේ ස්වමීන්වහන්ස.

හොඳයි මම හිතන්නේ කාල වෙලාව ඉක්ම ගිහින් තිබෙනවා. අදත් අපිට ඉමහත් ප්‍රයෝජනයක් උනා ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ විසින් විස්තර කරන ලද මේ ධර්ම කරුණු. හැමෝටම මනසිකාරයක යෙදෙන්න අවස්ථාවක් ලැබෙනවා මේ වගේ සූක්ෂම ධර්ම මෙනෙහි කිරීම තුලින්. සවනට සිසිලස වෙනුවෙන් ඔබ වහන්සේ මේ කරන සත්කාරයට මේ ධර්ම දානයට අපි පුණ්‍යානුමෝදනා පුද කරනවා ස්වාමීන්වහන්ස. අප්‍රමාණ පිං. ඔබ වහන්සේට ඉතාමත් ගෞරවයෙන් යොමුවෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන්න. තෙරුවන් සරණයි!

හොඳයි පින්වත්නි, සැම දෙනාටම තෙරුවන් සරණයි! අදත් අපි අපේ වේලාවෙන් මධ්‍යම රාත්‍රිය වගේ වෙනකම් මේ ධර්ම කථාව සිද්ධ කරගෙන ආව. අපේ පින්වතුන් අද මේ කියපු ධර්ම කාණ්ඩය සිතලා මෙනෙහි කරලා තේරුම් ගන්න උත්සාහ කරන්න ඇති කියලා අපි විශ්වාස කරනවා. මේ ධර්මය ඇසීමෙන් ධර්මය හිතීමෙන් ධර්මය මෙනෙහි කිරීමෙන් උපදවාගත්තාවූ සියලුම කුසල බලයෙන් පින්වත් සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය සුවසේම සිද්ධ වේවා!

මෙහෙය වීම සිද්ධ කරන්නාවූ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයාටත් පවුලේ සැම දෙනාටමත් පින්වත් ජයන්ත මහත්මා ඇතුළු අපේ ශ්‍රාවක මණ්ඩලයේ සැම දෙනාටමත් ධර්මමය සැනසිල්ල ධර්මමය ප්‍රබෝධය ඇතිවේවා! සියලු දෙනාගේම සිත් වලට ධර්ම ශාන්තිය මතු වේවා! මේ භයංකර හේතු ඵල ධර්ම රාමුවේ ඉන්න තාක්කල් අපායවල් හැදෙනවා. දුක් ඇති ස්ථාන හැදෙනවා. භව හැදෙනවා. ශාන්තියක් සැපයක් නැති තැනක් වෙනවා. මේ හේතු ඵල ධර්මයන් ගැබ් වෙලා තිබෙන තැනක සිද්ධ වෙන අමුතුම විදියේ ක්‍රියා කාරී ස්වභාවයක්, ඒ ඒ සන්ධි වල සිදුවෙන දෙයක් අපි මේ කථා කළේ. මේකේ අවසානය නොවෙයි මේ. තව තිබෙනවා ඉස්සරහට කථා කරන්න. මේ පින්වතුන් ඒවාට සූදානම් වෙන්න. අද මේ කථා කිරීමෙන් ඇතිකර ගත්තා වූ සියලු කුසල් බලයෙන් ධර්මය ඇසීමෙන් උපදවා ගත්තු සියලු පින් බලයෙන් සැම දෙනාටම ගාම්භීර ලෙස සූක්ෂම ලෙස සැපවත් ලෙස සැප ප්‍රතිපදාවේ ඉක්මන් ඵල වශයෙන් සුඛාපටිපදා ඛිප්පා අභිඤ්ඤා වශයෙන් සැමදෙනාටම සුවසේම ධර්ම අවබෝධය වේවා! අපිට ඉතා ඉක්මනින් වහ වහාම කෙටි කාලයකදී මේ භවයේ හෝ වේවා නුදුරු තැනකදී හෝ වේවා කොහේ හරි තැනක ඉතා ඉකමනින් අපේ ලොව්තුරා බුදුරජාණන්වහන්සේ ගෞතම සම්මා සම්බුදුරජාණන්වහන්සේ ඊට කලින් කාශ්‍යප නමින් පහළ වූ සම්මා

සම්බුදුපියාණන්වහන්සේ උන්වහන්සේගේ ශ්‍රාවයන් වහන්සේලා ඊට පෙර බුදු වූ බුදුරජාණන්වහන්සේලා ඒ ශ්‍රාවයන් වහන්සේලා රහතන්වහන්සේලා ලෙස වැඩ සිටි උත්තමයන් වහන්සේලා භික්ෂුණීන් වහන්සේලා හැටියට වැඩ සිටි උත්තමාවියෝ ඇතුළු ඒ රහත් ආර්ය උත්තමයන් වහන්සේලා සැපසේ සැනසී සැනසී රූප වශයෙන් ගස් යට ගෙවල් වල විහාරස්ථාන වල වැඩ ඉඳගෙන මනෝමය වශයෙන් මේ විසිතුරු ධර්මය මෙනෙහි කරගෙන නුවණ පුබුදුවාගෙන ප්‍රඥාව පුබුදුවාගෙන ඒ නුවණින් ඒ ප්‍රඥාවෙන් අවබෝධ කරගත්ත රස විඳපු සපර්ශ කරගත්ත ඒවාගේම මුණ ගස්සා ගත්ත ශාන්ත වූ ධර්මයක් තිබෙනවා. ඒ ධර්මය නිර්වාණයයි. ඒ නිර්වාණය, ඒ නිවන් සැප සැමදෙනාටම මේ පින් බලයෙන් සැපසේ අවබෝධ වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.